# දික්කසාදය (Divorce)

RDL ට අනුව දික්කසාදයට පදනම් 2කි.

1) අනාචාරය

2) ද්වේෂ සහගත හැර යාම.

<u>දික්කසාදයට පදනම</u>

1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි ලියාපදිංචි කිරීමේ ආඥා පනත.

19(1) - අධිකරණ තීන්දුවක් මගින් දික්කසාදය ප්‍රකාශයට පත් කරන තෙක් විවාහය බල පැවැත්විය යුතුය.

19(2) - දික්කසාදයට පදනම

1) විවාහයෙන් පසු අනාචාරය.

2) ද්වේෂ සහගත අතහැර යාම.

3) විවාහ වන අවස්ථාවේ පැවති ලිංගික බෙලහීනතාවය

මීට අමතරව,

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 608(2) ට යටත් ප්‍රතිපාදන අනුව අධිකරණමය වෙන් වීම යටතේ අදාල අවශ්‍යතා සපුරා ඇති විටද, දික්කසාදය ලබා ගත හැකිය.

# *(1) විවාහයෙන් පසු අනාචාරය*

## යනු?

විවාහයට පිටින් සිය කැමැත්තෙන්ම

තම කලත්‍රයා නොවන වෙනත් පුද්ගලයෙකු සමඟ

ලිංගික සම්බන්දතා පැවැත්වීමයි.

- අනාචාරය ස්ව කැමැත්තෙන්ම කල යුතුය.
- අනාචාරය යනු සිවිල් වරදක් මිස අපරාධ වරදක් නොවේ.
- අනාචාරය යටතේ යම් වින්තිකරුවෙකු නම් කල යුතුය.
- එසේ එම වින්තිකරුවෙකු නම් නොකර සිටිය හැකි අවස්ථා

  1) එම වින්තිකරු මියයාම.

  2) එම වින්තිකරු සොයාගත නොහැකි වීම.

  3) සල්ලාලයෙකු හෝ ගණිකාවක් වීම.

## අනාචාරයේ ඔප්පු කිරීමේ භාරය

- අනාචාරය පිළිබඳ චෝදනා නගන පාර්ශවයට පැවරේ.
- අනාචාරය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුය.

## Cases

*Ginesi Vs Ginesi*

අපරාධ වරදකදී ඔප්පු කල යුතු භාරය පවතී.

*Preston Vs Preston*

මෙහිදී දික්කසාදයකදී ස්වාමිපුරුෂයාගේ ඔප්පු කිරීමේ භාරය අපරාධ වරදකදී ඔප්පු කිරීමේ භාරය මෙන් වැඩි බවයි.

*Gower Vs Gower*

අනාචාරී වරද ලංකාවේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුය.

*Jayasinghe Vs Jayasinghe*

මෙම නඩුවේදී ප්‍රකාශ කලේ භාර්යාව අනාචාරය සිදු කොට තිබුනද ස්වාමිපුරුෂයා ඒ සම්බන්දව ඇයට සමාව දුන් දිනයේ සිට අනාචාරය පිළිබද සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල නොහැකි නම් අනාචාරය මත දික්කසාදය ලබා ගත නොහැකි බවයි.

*Alarmalammal Vs Nadarajah*

*Dharmarsena Vs. Navaratne*

## <u>සමවිත්තිකරුවෙකු නම් කිරීම</u>

අනාචාරී වරද යටතේ දික්කසාදය ලබා ගැනීමට නම් සමවිත්තිකාරයෙකුද නම් කල යුතුය.

**සිවිල් නඩු විධාන සංග්‍රහයේ 598 වගන්තිය** ප්‍රකාරව

1) සිදු වූ මානසික හානියට

2) කලත්‍රයා නොමැති වීම නිසා සිදු වූ හානියට වන්දි ලබා ගත හැකිය.

<u>සම විත්තිකරුවෙකු නම් නොකර සිටිය හැකි අවස්ථා</u>

1) අනාචාරයේ හැසිරුණු පුද්ගලයා විවාහක බව නොදන්නේ නම්

2) සම විත්තිකරු සොයා ගත නොහැකි විට

3) සම විත්තිකරු මිය ගිය විට

*Zeigan Vs Zeigan*

*Annakade Vs Myappan*

*Eliyatamby Vs Corbriel*

## <u>*සිදු වූ හානියට වන්දි*</u>

සමවිත්තිකරුවන්ගෙන් වන්දි ලබා ගත හැකිය.

*De Silva Vs De Silva*

මෙම නඩුවේදී සම විත්තිකරුගෙන් වන්දි ඉල්ලුම් කල හැකි මූලධර්ම 2ක් දැක්වීය.

1) හානිය

2) කලත්‍රයාගේ වටිනාකම

-හානිය මත පදනම්ව වන්දි ලබා ගැනීමේදී තම කලත්‍රයාගේ අනාචාරී හැසිරීම නිසා තමාට, තමාගේ පවුලට වූ මානසික බලපෑම දැක්විය හැකිය.

-කලත්‍රයාගේ වටිනාකම මත පදනම්ව වන්දි ඉල්ලීමේදී තම බිරිද හෝ සැමියා තම ව්‍යපාර වලට දැක්වූ සහය ගේ දොර කටයුතු පවත්වාගෙන යාම අඩාල වීම ආදිය දැක්විය හැකිය.

*Alles Vs Alles*

*Dean Vs Anthonize*

*Perera Vs Halawathura*

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 612 වගන්තිය යටතේ අනාචාරී වරද ඔප්පු වූ විට සම විත්තිකරුවන්ගෙන් වන්දි හිමි වේ.

***<u>සමාව දීම</u>***

Voet ට අනුව නිර්දෝෂී කලත්‍රයාගේ ප්‍රකාශිත කැමැත්ත දක්වමින් හෝ අනාචාරයෙන් පසුවත් ඔහු / ඇය සමග ලිංගික සංවාසයෙන් සමාව දිය හැක.

*Keats Vs Keats*

ලිංගික සංසර්ගයක් සිදු වීමෙන් සමාව දීම සිදු වූ බවට පිලි ගැනේ.

*Karunathilake Vs Karunatilleke*

*Jayasinghe Vs Jayasinghe*

*Sedirissinghe Vs Somawathie*

## ***<u>(2) ද්වේෂ සගගත හැර යාම</u>***

➤විවාහය අවසන් කිරීමේ චේතනාවෙන් හෝ අනෙක් පාර්ශවයේ කෘරත්වය හා විවාහය අවසන් කිරීමේ චේතනාව නිසා අහිංසක කලත්‍රයා නිවසින් පිට වී යාමයි.

➤කෘරත්වය අධිකරණමය වෙන් වීමට පදනමක් වුවද දික්කසාදයට පදනමක් නොවේ.

*Silva Vs Misinona*

මෙම නඩුවේදී ද්වේෂ සහගත හැරයාම විග්‍රහ කර ඇත්තේ විවාහයේ වගකීම් සිතාමතාම හා ඕනෑකමින් පැහැදිලි හා අවසානාත්මක ලෙස ප්‍රතික්ෂේප කිරීමයි.

ද්වේෂ සහගත හැරයාම පිළිබඳ චෝදනාවකදී

1) හැරයාමේ ක්‍රියාව හෙවත් factum

2) විවාහ සම්බන්දතා අවසන් කිරීමේ චේතනාව හෙවත් animus

යන අංග 2ම තිබිය යුතුය.

➤වෛවාහක නිවාස අතහැර යාම හෝ එකම වෛවාහක නිවාස තුල ජීවත් වුවත් ලිංගික සබඳතා පැවැත්වීම දිගටම හා අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කිරීම වැනි ක්‍රියා කලාපයන් අත්හැරයාමේ ක්‍රියාව හා සහවාසය අවසන් කිරීමේ චේතනාවට සාක්ෂි ලෙස ඉදිරිපත් කල හැකිය.

➤අතහැරයාමක අත්‍යවශ්‍ය අංගය වන්නේ වෛවාහක සබදතා අවසන් කිරීමේ අදහසින් සංවාසය අවසන් කිරීමයි.

➤අතහැරයාම අඛණ්ඩ අවිවාහක වරදක් විය යුතුය. ඒ නිසා අතහරයාමේ චේතනාව හෝ ක්‍රියාව වෙනස් වන විට ඔප්පු කිරීම මත ඕනෑම වෙලාවක එය අවසන් කල හැක.

➤RDL යටතේ සමාදාන වීමේ අදහසක් පවතී නම් එවිට දික්කසාද තීන්දුව ලබා නොදේ.

➤ස්ත්‍රියක් තම ස්වාමියාගේ කැමැත්තට විරුද්ධව ඔහුව හැර යාම ද්වේෂ සහගත වීමට ප්‍රමාණවත්ය.

➤එක් පාර්ශවයක් නැවත සංවාසයට ආරාධනා කරන විට අනෙක් පාර්ශවය එය ප්‍රතික්ශේප කරන්න ඒකමතික වෙන්වීමක තත්ත්වය එමගින් ද්වේශ සහ ද්වේශ සහගත වෙන්ව වීමක් දක්වා වෙනස් කළ හැකිය

## ***1. සාමාන්‍ය ද්වේශ සහගත හැරයාම***

➤කාලාත්‍රයෙක් විසින් වෛවාහක නිවස වලංගු සාධාරණ හේතුවක් නොමැතිව විවාහය අවසන් කිරීමේ අදහසින් හැර යයි නම් එය සාමාන්‍ය ද්වේශ සහගත් හැරයාම නම් වේ.

➤වර්ග තුනකි

1) හැරයන කලත්‍රයා විසින් විවාහය අවසන් කිරීමේ ස්ථිර අදහසින් වෛවාහක නිවස අතහැර යාම

2) පාර්ශවයක් සිතාමතාම / චේතාන්විතව හෝ බලකිරීම නිසා වෙන්ව සිටීනම් හා එක් කාලාත්‍රයෙක් විසින් එකම නිවස තුළ අනෙකා සමඟ නැවත ලිංගිකව එක් වීමේ අදහසක් නොමැතිව හැරයාමේ චේතනාවෙන් සිටීම

3) එක් කාලාත්‍රයෙක් විසින් සංවාසය අවසන් කිරීම සමඟ ද්වේෂ සහගත වචන හෝ ක්‍රියා සිදු කරමින් හැර යාමේ අදහස පෙන්වන නමුත් කලාත්‍රයන් දෙදෙනාගෙන් කිසිවකු වෛවාහක නිවස අතහැර නො ගොස් සිටීම

මෙම අවස්ථාවේදී අනෙකාගේ හැසිරීම් නිසා එක් සංවාසය නතර කිරීමට බල කරයි නම් දෙදෙනා එකම වෛවාහක නිවසේ රැදී සිටියද එය අනුමිත ද්වේශ සහගත හැරයාමකි.

*Attanayake Vs Attanayake*

*Goonawardene Vs Wicramasinghe*

*Herft Vs Herft*

## 2.අනුමිත ද්වේශ සහගත හැරයාම

➤ නිර්දෝෂී පාර්ශව වෛවාහක නිවස අත්හැර යාමට හේතු වූයේ අනෙක් පාර්ශවයේ නෙරපීම් සහගත ක්‍රියාවක් වන සෘජු ප්‍රතිඵලයක් ලෙස බව ඔප්පු කළ යුතුය.

*Anulawathie Vs Gunapala*

H.R.Halo-

අනෙක් විවාහය අවසන් කිරීමේ චේතනාවෙන් සිටි බව ඔප්පු කළ යුතුය

➤කලත්‍රයා විසින් හෝ කලත්‍රයාගේ නිවසේ වෙනත් අයෙකු විසින් කෲර සහගත හැසිරීම පිළිබඳ සාක්ෂි තිබුණේ නම් හෝ ස්වාමියා අනාචාරය පිළිබඳ ඔප්පු වීම නිසා අනුමිත ද්වේශ සහගත හැරයාමට වැරදිකරු වේ.

*Somawathi Dias Vs Alwis*

මවට කෲර ලෙස හැසිරීමට ඉඩ ලබා දුන් දා පටන් ඔහු කෲරත්වයට වැරදිකරු වේ

*Menike Vs Dissanayake*

තම බිරිඳ නිවසින් එලවීම පිළිබඳ සැමියා වැරදිකරු වෙයි. යහපත් චේතනාවෙන් සාමදාන කිරීමට උත්සාහ කිරීම මගින් අනුමිත ද්වේශ සහගත හැරයාම අවසන් විය හැකිය.

*Neville Fernando Vs Chandrani Fernando*

RDL අනුව ස්වාමියා විසින් බිරිඳට නවාතැන් සැපයීම සිදු කළ යුතු අතර ඇයට වෙනත් විකල්ප වාසස්ථානයක් නොදී හෝ නඩත්තු නොදී වෛවාහක නිවසින් පිටමං කළ නොහැක

*Dias Vs Kodithuwakku*

අධිකරණය මගින් දික්කසාදය ලබාදෙන තෙක් බිරිඳට වෛවාහක නිවසේ රැඳී සිටීමට අයිතිය ඇත

## *(3) විවාහ වන අවස්ථාවේ පැවැති ලිංගික බෙල බෙලහීනතාවය*

➤විවාහ වන අවස්ථාවේ දී පැවැත්විය යුතුයි

➤ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය පිළිබඳ සලකා බලයි

*Gunathilake Vs Mili Nona*

Akbar විනිසුරු-

ලිංගික බෙලහීනතාව යන සාධකය මත විවාහය විසුරුවා හැරීම යුක්ති සහගත වීමට නම් සංසර්ගයට ඇති බාධාව සුව කල නොහැක්කක් විය යුතුය. එය විවාහයට පෙර සිටම පැවති යුතු වීම හා දික්කසාදය ඉල්ලන පාර්ශවය විවාහ වූ විට විවාහ වන විට දැනු එය දැන් සිටිය යුතුය.

ලිංගික බෙලහීනතාවය පැවති යයි චෝදනා ලද කාන්තාව ප්‍රතිකාර ගැනීම ප්‍රතික්ෂේප කරයි නම් ස්වාමියාට දික්කසාද වීමට ඉල්ලා සිටිය හැකියි.

මෙම නඩුවේදී බිරිඳ සුව කළ නොහැකි ලිංගික බෙලහීනතාවයකින් පෙළෙන බවත් ඇය කන්‍යාවක වූ බවත් වෛද්‍ය සාක්ෂි මගින් තහවුරු විය. භාර්යාවගේ සුව කළ නොහැකි ලිංගික බෙලහීනතාවය මත දික්කසාද තීන්දුව ලබා දුනි.

➤විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ දික්කසාදයට අමතරව සිවිල් නඩු විධාන සංග්‍රහයේ සංශෝධිත වගන්ති වලට අනුව අදාළ දිසා අධිකරණයට කරුණු දැක්වීමෙන් දික්කසාදය ලබා ගත හැකියි. නමුත් තෙන්නකෝන් එ. තෙන්නකෝන් නඩුවට අනුව අධිකරණය වෙන්වීමේ තීන්දුවකින් අවුරුදු 2ක් සිට ඇත්තෙකු හෝ සහවාසයෙන් හා සංවාසයෙන් වසර 7ක් වෙන්ව සිටි කලත්‍රයෙකුට විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ දික්කසාදයට අවශ්‍ය පදනම් 3න් 1ක් ඔප්පු කර ලසු පාරකින් දික්කසාදය ලබා ගත හැකිය.

*****************************************************

## PAST PAPER QUESTIONS

*2019 October (1)

*2018 October (1)

*2018 April (1)

*2017 October (7)

*2016 October (3)

*2016 April (4)